Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/

# අන්තර්ජාලය භාවිතයෙන් සංගීතය අධ්‍යයනය

අන්තර්ජාලය වර්තමානයේ තොරතුරු පිරික්සීම හා තොරතුරු සන්නිවේදනය සඳහා බහුලවම භාවිතා වන මාධ්‍යයකි. විශ්වීය මාධ්‍යක් වන මෙය ලොව පුරා කොතැනක වුවද ඇති විවිධ වූ තොරතුරු සැනින් සොයා බැලිය හැකි මාධ්‍යයකි. සංගීත අධ්‍යාපනය සඳහා ද අන්තර්ජාලයෙන් විශාල පිටිවහලක් ලබා ගත හැකිය විශේෂයෙන්ම සංගීත නිර්මාණකරණය, තොරතුරු ලබා ගැනීගැනීම, නිර්මාණ රසවිඳීම, නිර්මාණ බෙදාහැරීම, සංගීත භාණ්ඩ වාදනය පුහුණුවීම, විෂය කරුණු අධ්‍යයනය ආදිය සඳහා අන්තර්ජාලය භාවිතා කළ හැකිය.මේ සඳහා අන්තර්ජාල සම්බන්ධතාවක් සහිත පරිගනකයක් හෝ අන්තර්ජාල සම්බන්ධතාවක් සහිත ස්මාර්ට් ජංගම දුකථනයක් අවශ්‍ය වේ.

සංගීතය සඳහා අන්තර්ජාලය භාවිතා කරන්නේ කෙසේද යන්න පහත කරුණු ඔස්සේ විමසා බලමු.

1. සංගීතය රසවිඳීම.
2. සංගීතය බාගත කිරීම (Download) කර ගැනීම.
3. සංගීත අධ්‍යාපනය
4. නිර්මාණ ප්‍රචාරය නැතහොත් මුද්‍රාහැරීම
5. නිර්මාණ ගබඩා කිරීම හා සංරක්ෂණය
6. තොරතුරු හා දත්ත හුවමාරුව


# 1. සංගීතය රසවිඳීම.

මේ සඳහා වර්තමානයේ බොහෝ දෙනා You Tube වෙබ් අඩවිය බහුලව භාවිත කරයි.

- අන්තර්ජාලයට පිවිසීම සඳහා පරිගනකයේ ස්ථාපනය කොට ඇති පහත මෘදුකාංග වලින් එකක් භාවිත කල හැකිය.



- මෙහි https://www.youtube.com ලෙස Type කරන්න. (මෙය වෙබ් ලිපිනය වන අතර URL ලෙසද හඳුන්වයි.)
- මෙහි සෙවීමට අවශ්‍ය දෙය Type කරන්න




- ස්මාට් ජංගම දුරකතනයක නම් මෙම යෙදුම (App) භාවිතා කළ හැක.




- ගීත රස විඳීමට හා භාගත කිරීමට පහසුකම් සළසන තවත් වෙබ් අඩවි කිහිපයක වෙබ් ලිපින (URL) පහත දැක්වේ.

www.music.lk
www.elakiri.com
www.sinhalageetha.com
www.anammanan.lk
www.topsinhalamp3.com
www.helanada.com
www.sinhalasongs.lk
www.sinhalajukebox.org
www.sinhalaoldhits.com





## සංගීතය බාගත කිරීම (Download) කර ගැනීම.

අන්තර්ජාල සම්බන්ධතාව නොමැති විට රස විඳීමට විවිධ පුද්ගලයින් අන්තර්ජාලය වෙත එක් කර ඇති ගීත, වීඩියෝ හෝ හඬ පමණක් ඇසිය හැකි MP3 ආකාරයෙන්ද භාගතකොට තබාගත හැකිය.

පරිගණකයදී You Tube video භාගත කිරීමට අමතර මෘදුකාංගයක සහාය ලබාගත යුතුවේ. iTubeGo එවැනි මෘදුකාංගයකි මෙම මෘදුකාංගය පළමුව පරිගනකයේ ස්ථාපනය කල යුතු වේ.(මෙම මෘදුකාංතය පරිගණකාය් ස්ථාපනය කර ගැනීමට මෙම URL එක භාවිත කල හැකිය https://itubego.com/youtube-downloader/)

<u>පියවර</u>

- **පළමුව වෙබ් බ්‍රවුසරය විවෘත කර අවශ්‍ය ගීතය සොයා ගත යුතුය.**
- **ඉන් පසුව වෙබ් ලිපිනය(URL) කොපි කරගත යුතුය**





- iTubeGo මෘදුකාංගය විවෘත කරන්න.




මෙහි ක්ලික් කරන්න

මෙහි වීඩියෝ හෝ MP3 දෙයාකාරයෙන්ම ඩවුන්ලෝඩ් කලහැකි අතර MP3 ආකාරයෙන් ඩවුන්ලෝඩ් කිරීමට මෙහි ක්ලික් කර MP3 තෝරාගන්න





ඩවුන්ලෝඩ් වීම අවසන් වූ පසු මෙහි ක්ලික් කිරීම මගින් ඩවුන්ලෝඩ් වූ ෆයිල් දැකගත හැකිය

ඉහත දැක්වූයේ YouTube වෙබ් අඩවියෙන් ගීත ඩවුන්ලෝඩ් කරගැනීමට සහය කරගත හැකි එක් මෘදුකාංගයක් වන අතර මෙවැනි තවත් මෘදුකාංග කිහිපයක් පහත දැක්වේ.


| | |
|---|---|
| 1. aTube Catcher | 6. Airy |
| 2. By Click Downloader | 7. Softorino YouTube Converter |
| 3. 4K Video Downloader | 8. Allavsoft |
| 4. Snapdownloader | 9. VideoProc |
| 5. AllMyTube | 10. uTube Downloader |

ස්මාර්ට් දුරකතනයකින් ද මෙසේ වීඩියෝ ඩවුන්ලෝඩ් කරගතහැකි පහසුකම YouTube ඇප් එකෙහිම සලසා දී ඇති අතර වෙනත් ඇප් බොහෝ ප්‍රමාණයක්ද දක්නට ලැබේ.





## 3. සංගීත අධ්‍යාපනය


සංගීත අධ්‍යාපනය සඳහාද අන්තර්ජාලය බෙහෙවින් ඉවහල් කරගතහැකි මාධ්‍යයකි. මෙහිදීද YouTube වෙබ් අඩවිය විශේෂ තැනක් හිමි කර ගනී. උදාහරණයක් ලෙස කිසියම් අයෙකුට ගිටාරයක් වාදනය කරන අයුරු අධ්‍යයනය කිරීමට අවශ්‍ය නම් YouTube වෙබ් අඩවියට පිවිස How To Play Guitar



ලෙස ටයිප් කල විට ගිටාර් වාදනය පිළිබඳ බොහෝ වීඩියෝ දර්ශනය කරගත හැක.

සංගීතය සම්බන්ධ අධ්‍යනයන්හිදී ඉතා වැදගත් වෙබ් අඩවියක් ලෙස විකිපීඩියා වෙබ් අඩවිය හැඳින්විය හැකිය. මෙය අන්තර්ජාල විශ්ව කෝශයකි. අවශ්‍ය ඕනෑම දෙයක් පිළිබඳව මෙම වෙබ් අඩවියට පිවිස Serch Box මත ටයිප් කිරීමෙන් සොයා ගත හැක.




ඉන් පසුව මේ අයුරින් දිස්වනු ඇත.

මෙවැනි තවත් විශ්වකෝශ කිහිපයක URL පහත දැක්වේ.

https://www.encyclopedia.com/ https://www.answers.com/

https://www.britannica.com/ https://www.reference.com/

https://www.worldbook.com/

මීට අමතරව සංගීතය පිළිබඳව ඉගෙනීමට තවත් බොහෝ වෙබ් අඩවි ඇත. මින් සමහර වෙබ් අඩවි වල මුදල් ගෙවා නිවසේ සිටම online තාක්ෂණයෙන් ඉගෙනීමට අවස්තාද සලසා ඇත.

https://asaphmusic.com/

http://www.upstartmusic.de/

https://mio.to/

https://www.shankarmahadevanacademy.com/

https://omenad.net/

http://www.musicschoolindia.com/

## 4.නිර්මාණ ප්‍රචාරය නැතහොත් මුදාහැරීම

ඔබ විසින් සකසන ලද සංගිත නිර්මාණ අන්තර් ජාලයට එක් කිරීම හා ප්‍රචාරණය කල හැකි ක්‍රම ගණනාවක් ඇත.

- YouTube මගින්
- Facebook වැනි සමාජ මාධ්‍ය ජාලා මගින්
- වෙනත් වෙබ් අඩවි සඳහා ලබා දීමෙන්
- තමාගේම වෙබ් හෝ බ්ලොග් අඩවියක් මගින්

මේ අතරින් කිහිපයක් වේ.මේ සඳහා වර්තමානයේ බොහෝ දෙනා YouTube බහුලව භාවිත කරන බව පෙනේ.

YouTube මගින් නිර්මාණයක් අන්තර්ජාලයට එක් කිරීම.

මෙහිදී මුලින්ම ඔබ සතුව Google ගිණුමක් තිබිය යුතු වේ. ඔබ සතුව Google ගිණුම ක් නොමැති නම් පහත URL එක සහිත YouTube වීඩියෝ එකෙන් Google ගිණුමක් සාදාගන්නා අයුරු විස්තර කෙරේ. ඉන් පසු තමාගේ නිර්මාණයක් අන්තර්ජාලයට එක් කිරීම සඳහා YouTube Channel එකක් සාදා ගත යුතුය. එය සාදාගන්නා අයුරු පහත URL එක සහිත YouTube වීඩියෝ එක අවසානයේ විස්තර කෙරේ.

https://www.youtube.com/watch?v=StIpBGysbrs

මෙම ක්‍රමයට අමතරව Music.lk, elakiri.com, ananmanan.lk වැනි ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ගීත වෙබ් අඩවි වෙත, එම වෙබ් අඩවියන්හි Contact වෙතින් දුරථන අංක ලබාගෙන ලබා දීම සිදු කල හැකි වේ.

## 5. නිර්මාණ ගබඩා කිරීම හා සංරක්ෂණය

අන්තර්ජාලය තුල ඔබගේ නිර්මාණ හා වැදගත් ලිපි, ඡායාරූප, සකැන් කරන ලද ලිපි ආදිය සුරක්ෂිතව ගබඩා කර තබා අවශ්‍ය අවස්ථාවක ලොව කොතැනක හෝ සිට ලබා ගැනීමට මෙන්ම තවත් අයෙකුට යැවීමේ හැකියාව පවතී. මේවා Cloud Storage ලෙස හඳුන්වයි. මෙහි ප්‍රධානම වාසිය වන්නේ ගොනු විනාශ වීමේ සම්භාවිතාව අවම වීමය. එමෙන්ම කිහිප දෙනෙකුට එකවර භාවිතා කලහැකි වීමද, තමාගේ දුරකතනය, ලැප්ටොප් පරිගනකය ආදී සියලු උපාංග සමග භාවිතා කල හැකි වීම නිසා එම උපාංග අතර ගොනු හුවමාරු කිරීමද ඉතා පහසු වේ. අන්තර්ජාලයේ මේ සඳහා පහසුකම් සපයන වෙබ් අඩවි විශාල ප්‍රමාණයක් පවතී පහත දක්වා ඇත්තේ එවැනි වෙබ් අඩවි කිහිපයක් සහ නොමිලයේ ලබා දෙන ඉඩ ප්‍රමාණයන්ය. වැඩි ඉඩ ප්‍රමාණයක් අවශ්‍යවූ විට මුදල් ගෙවා ඉඩ ප්‍රමාණය වැඩිකර ගත හැකියාවද පවතී.

Icedrive 10GB

Mega 50 GB

Microsoft One Drive 15GB

Google Drive 15GB

Drop Box 50 GB

iCloud 15GB

MediaFire

Media Fire 20GB

වර්තමානයේ භාවිත වන බොහෝ ඇන්ඩ්‍රොයිඩ් ස්මාර්ට් දුරකථන වල Google ගිණුමක් භාවිත වන බැවින් Google Drive පහසුකම එම දුරකථන වල ඇතුලත්ව ඇත. එහෙයින් දුරකථනයේ ඇති ගොනු පහසුවෙන්ම මෙම Google Drive හි ගබඩා කිරීම කල හැක. මෙම URL එක මගින් තවදුරටත් විස්තර දැනගත හැකිය.

https://www.youtube.com/watch?v=iIZMpFcQTdg

## 6. තොරතුරු හා දත්ත හුවමාරුව

තොරතුරු හා දත්ත හුවමාරු කිරීමේදී අන්තර්ජාලය අද වන විට ඉතා විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඊ මේල් හෙවත් විද්‍යුත් තැපැල හරහා දත්ත හුවමාරු කිරීම වැඩි වශයෙන් සිදුවන අතර, අද වන විට අප ඉහතින් සාකච්ඡා කල Cloud Storage හරහා දත්ත හුවමාරු කිරීමට පෙළඹෙමින් සිටී. ඊ මේල් හරහා ගොනු හුවමාරු කිරීමේදී 25MB ප්‍රමාණයට දත්ත සීමාවන අතර Cloud Storage ක්‍රමයේදී විශාල ධාරිතාවෙන් යුතු ගොනු හුවමාරු කල හැකිය.

ඊ මේල් පහසුකම ලබා දෙන සමාගම් කිහිපයත් පහත දැක්වේ

Google – gmail
Yahoo – yahoomail
MSN - hotmail

මෙම ක්‍රමයේදී MP3 ගොනු එකක් හෝ කිහිපයක් හුවමාරු කරගත හැකියාව පවතී.

බොහෝ ස්මාර්ට් ජංගම දුරකථන වල මෙම ඊ මේල් පහසුකම අන්තර්ගතව පවතින අතර. වර්තමානය වන විට වට්ස්ඇප්, ඉමෝ, වයිබර්, ෆේස්බුක් මැසෙන්ජර්,වැනි සේවාවන් ඔස්සේ ගීත හා වෙනත් ගොනු හුවමාරු කිරීමට ජනතාව හුරුවී සිටිති.

**පැවරුම**-:

1. අන්තර්ජාලයෙහි වීඩියෝ මගින් සංගීතය රස විඳීමට පහසුකම් සපයන ජනප්‍රිය වෙබ් අඩවිය කුමක්ද?
2. අන්තර්ජාලය මගින් ගීත ඩවුන්ලෝඩ් කිරීමට පහසුකම් සපයන වෙබ් අඩවි 3ක් නම් කරන්න.
3. අන්තර්ජාලයට පිවිස සංගීතය පිළිබඳ අධ්‍යයනය කල හැකි විශ්වකෝෂ වෙබ් අඩවියක් පිරික්සා **යානී** නම් බටහිර සංගීත නිර්මාණකරුවාගේ ජීවන තොරතුරු සහ සංගීත නිර්මාණ පිළිබඳව බිත්ති පුවත් පතට ලිපියක් සකස් කරන්න. (ලිපිය අවසානයේ ඔබ තොරතුරු උපුටා ගත් වෙබ් පිටුවෙහි ලිපිණය URL එක සඳහන් කරන්න.)